මාන්තෙයි (බටහිර) ප්‍රාදේශීය සභාව

මන්නාරම දිස්ත්‍රික්කය.

----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 15 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2014 ජුලි 08 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මාන්තෙයි (බටහිර) ප්‍රාදේශීය සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මාන්තෙයි (බටහිර) ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණු වත්කම් වටිනාකම රු.40,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

---

එකතුව රු.9,057,888 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සඳහා අවශ්‍ය වූ තොරතුරු විගණනයට ලබා නොදීම නිසා එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම්

---

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි වලට යොමුව. | | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | <u>ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති - 1988</u> | | |
| (I) | පරිච්ඡේදය IX - රීති 180 | - | මුදල් හා ගබඩා භාරව සිටින නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි. |
| (II) | පරිච්ඡේදය III - රීති 81 | - | සෑම වර්ෂයකම එක් එක් කාර්තුව අවසානයේදි මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (III) | පරිච්ඡේදයVII - රීති 153 | - | හිඟ හිටි ආදායම් පිළිබඳව ප්‍රාදේශීය සභා 07 ආකෘතිය විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (IV) | පරිච්ඡේදය VII - රීති 163 | | ආදායම් පිළිබඳ ප්‍රාදේශීය සභා 19 ආකෘතිය පවත්වාගෙන ගොස් නොතිබුණ. |

| | | |
|---|---|---|
| (ආ) | අංක අයිඒඅයි/2002/02 හා 2012 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර ලිපිය | - පරිගණක හා උපාංග ලේඛණය පවත්වා නොතිබුණි. |

2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශ වලට අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.21,255,213 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.104,908 ක් විය.

2.2 මුල්‍ය කළමනාකරණය

අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරික්ෂණය වූයෙන් අයවැය යථාර්ථ පදනමක් මත පිළියෙල කර නොමැති බව නිරික්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 අයවැයගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | අයවැයගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 2,745,000 | 2,122,656 | 8,500 |
| ( ii)බදු කුලි | 320,000 | 355,040 | - |
| (iii)බලපත්‍ර ගාස්තු | 2,575,360 | 2,027,781 | - |
| (iv)වෙනත් ආදායම් | 1,961,893 | 1,187,520 | - |

2.3.2 මුද්දර ගාස්තු

----------------

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු රු.5,151,195 ක් වූ මුද්දර ගාස්තු ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි. එනමුත් මුද්දර ගාස්තු නිරවුල් කිරිම සඳහා වූ උපලේඛන රෙජිස්ට්‍රාර්ජනරාල් වරයාගෙන් ලැබී තිබුණි.

2.3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 571 පරිදි කල් ඉකුත් වූ අවුරුදු 02 ට වැඩි තැන්පතු නිරාකරණය කිරිමට කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ

| තැන්පතු ස්භාවය | තැන්පතු කාලය | මුදල |
|---|---|---|
| | | රු. |
| හඳුනා නොගත් තැන්පතු | අවු.2 ට වැඩි | 2,169,703 |

(ආ) රු.54,490 ක් වූ හඳුනා නොගත් තැන්පතු දෙකක ශේෂය ගිණුම් වල ජංගම බැරකම් යටතේ ණය හිමියන් වශයෙන් දක්වා තිබුණි. එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරිමට හෝ ආදායමට ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.3.4 කාර්ය මණ්ඩල ණය අය කිරිම.

------------------------------

දීර්ඝ කාලයක් තුල අය නොවි පවතින රු.38,095 ක් වූ කාර්ය මණ්ඩල ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

--------------------------

නිෂ්ක්‍රිය සහ ඌණ උපයෝජිත භෞතික සම්පත්

--------------------------------------------------

ප්‍රාදේශිය සභාවට අයත් පහත සඳහන් වාහන අවුරුදු 3 කට වඩා වැඩි කාලයක් නිෂ්ක්‍රියව පැවතිණි.

| වාහන වර්ගය | වාහන අංකය |
| --- | --- |
| ට්‍රැක්ටර් | -- |
| ට්‍රැක්ටර් | - |
| යතුරු පැදිය | NPJB-3378 |
| පික්අප් රථය | WPLG-9008 |
| ට්‍රැක්ටර් | NPRB-4226 |
| ට්‍රේලරය | NPRW-0269 |
| ජල බවුසර්- ට්‍රේලරය | NPRV-8659 |
| ජල බවුසර්-ට්‍රේලරය | NPRV-8660 |

2.5 අභ්‍යන්තර විගණනය

----------------------

සභාවේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති සහ පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් රැස්කිරිම

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ගිණුම්කරණය

(ඈ) වාහන උපයෝජණය

(ඉ) අයවැය